# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2012 නොවැම්බර් මස 16 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2012.11.19 දින නිකුත් කරන ලදී)**

# ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන)

**2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

විදේශ කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය* : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ,—

(අ) මානුෂීය පදනමක් මත ලබා දී ඇති නිදහස් කිරීම ඉවත් කිරීම; සහ

(ආ) ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානවලට ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් ලබා දීමේ වරද සම්බන්ධයෙන් දඬුවමක් හඳුන්වා දීම වේ.

*3 වන වගන්තිය* : මේ වගන්තිය මගින්, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඊ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*4 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

## ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන)

එල්.ඩී.—ඕ. 30/2012.

## 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 2012 අංක  දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2005 අංක 25 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (2අ) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2අ) යම් ත්‍රස්තවාදියකුට, ත්‍රස්තවාදීන්ට හෝ ත්‍රස්තවාදී සංවිධානයකට යම් ද්‍රව්‍යමය ආධාර හෝ සම්පත් නීති විරෝධී ලෙස සහ සිතා මතා ඍජුව හෝ වක්‍ර ආකාරයකින් සපයන හෝ සැපයීමට කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.";

(2) එහි (3) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති" යන වචන හා ඉලක්කම් වෙනුවට "මේ වගන්තියේ (1) වන උපවගන්තියේ, (2) වන උපවගන්තියේ හෝ (2අ) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

2—PL 006718—475 (2012/11)

(3) එහි (4) වන උපවගන්තියේ “මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ” යන වචන හා ඉලක්කම් වෙනුවට “මේ වගන්තියේ (1) වන උපවගන්තිය, (2) වන උපවගන්තිය හෝ (2අ) වන උපවගන්තිය යටතේ” යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඊ වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4ඊ වන වගන්තියේ (3) වන උපවගන්තියේ “එම වටිනාකම දඩයක් වශයෙන් අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම්කිසි කාලසීමාවක් තුළ ගෙවන ලෙස ඔහුට ආඥා කරනු ලැබිය යුතු ය.” යන වචන වෙනුවට “එම වටිනාකම දඩයක් වශයෙන් අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම්කිසි කාලසීමාවක් තුළ ගෙවන ලෙස ඔහුට ආඥා කරනු ලැබිය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ “3 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන්” යන වචන හා ඉලක්කම් වෙනුවට “3 වන වගන්තියේ (1) වන උපවගන්තිය, (2) වන උපවගන්තිය හෝ (2අ) වන උපවගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන්” යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.